## කවරයේ කතාව - අනාගත ලෝකය

# විසිඑක්වන සියවසට, තෙවන සහශ්‍රකයට අත වැනීම

එඩ්වින් ආරියදාස

ලෙදුහසේ දෙසැම්බර් මස තිස් එක්වනදා මධ්‍යම රාත්‍රිය පසුවූ භාගයේ විසිඑක්වන සියවසත්, ඒ හා අත්වැල් බැඳගෙන තෙවන සහශ්‍රකයත් උදාවෙති.

මෙය කැලැන්ඩරයේ වෙනසක් පමණක් ද? ලෝකයේත් ජගත් ජනකායගේත් වෙනසක් මේ හා සමග සිදු නොවන්නේ ද? මෙයට කෙටි පිළිතුරක් දිය හැකි ය.

විසිඑක්වන සියවසේ දී ලෝකයේ ජන ජීවිතය වෙනස් වන්නේ ම ය. මෙයට ප්‍රධාන හේතු කිහිපයකි. ලෝකයේ සමාජ විකාශනය කෙරේ බලපාන විද්‍යාඥයෝ සහ පණ්ඩිතයෝ මේ මෙහොත දෙස ඇස දල්වා බලා උන්හ. ඒ හේතු කොටගෙන නව නිර්මාණ නව තාක්ෂණික ක්‍රම හා අලුත් ම විදිහේ චින්තන රටාවකුත් විසිඑක්වන සියවස තුළ දී ලොව පහළ වෙති.

විසිඑක්වන සියවසේ දි අමුතු යමක් සිදුවේ යයි ලොව පුරා කවුරුත් බලා සිටින්නට පුරුදු වූ නිසා ම මේ අලුත් යුගයේදී විවිධ වර්ගවල වෙනස් වීම් සිදු විය.

විසිඑක්වන සියවසට තැඹුරු වී සිටි ලෝකයේ සිදුවූ ප්‍රබල විපර්යාසවලින් බොහොමයකට ම ක්ෂේත්‍රය වූයේ විද්‍යාව හා තාක්ෂණය යි.

මේ සියලු නව නැම් අතරතුරෙන් අත්‍යන්තයෙන් ම කේන්ද්‍රිය සිද්ධිය වශයෙන් මා දකින්නේ 2000 ජූනි මස 26 වැනි දින ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේ ජනාධිපතිවරයා ප්‍රමුඛ පිරිසක් විසින් ධවල මන්දිරයේ සිට කරන ලද ප්‍රකාශනයකි.

*මෙම මහා සොයා ගැනීම අනාවරණය කර ගත් ලොව ඇමතු ජනාධිපති බිල් ක්ලින්ටන් ඒ සොයා ගැනීමේ ප්‍රබලත්වය හොඳින් අවබෝධ කොට ගෙන සිටියේ ය. "" අපි දෙවියන් වහන්සේගේ පොතෙන් පිටුවක් ලබා ගත්තෙමු " යි ඔහු අභිමානයෙන් පැවසුවේ ය. විද්‍යාඥ කණ්ඩායමේ නායක ආචාර්ය ෆැන්ක් කොලින්ස් ද එවැනි ම පද මාලාවක් භාවිත කළේ ය."" මෙතෙක් දෙවියන් වහන්සේ පමණක් දැන සිටි රහසක් අපි අනාවරණය කොට ගත්තෙමු" යි ඔහු කියා සිටියේ ය.*

*මෙසේ විසිඑක්වන සියවස ආරම්භ වන්නේ මිනිසා විසින් දෙවියන් වහන්සේ සතු දේත් "සොරකම්" කරමිනි.*

මේ ප්‍රකාශය විසින් මානව පරිනාම න්‍යාය ආපිට පෙරළන ලදී. මෙතෙක් මානව සංහතිය සතු විස්වාසය වූයේ අප විකාශන පද්ධතියට ගොදුරු වී සිටින බවයි. මිනිසා පරිණාමයට පත්වන්නේ ස්වභාවික න්‍යායට අනුව නිසා මිනිසාට කළ හැකි දෙයක් නැත. මිනිසා අසරණ ය. පරිණාම න්‍යාය ක්‍රියාවේ යෙදෙන හැටියට අපට හැඩ ගැසෙන්නට වේ. මේ ගැන අපට කර කියා ගත හැකි දෙයක් නොමැත.

එහෙත් ඇමරිකාවේ විශේෂඥයෝ එසේ අසරණව පරිණාමයට ගොදුරු වෙන්නට අකැමැති වූහ. ඔවුහු පරිණාම න්‍යාය පාලනය කොට සොබාදහමේ නියාමයන් වෙනස් කරන්නට දැඩි අධිෂ්ඨානයකට එළඹුනහ.

1989 ජනවාරි මාසයේදී ඔවුන්ට වගකීමක් බාරදෙන ලදී. ඒ වගකීම (කොන්ත්‍රාත්තුව) නිමා කරන්නට ඔවුන්ට පසළොස් වසක් කල් දෙන ලදී. කුමක් ද මේ කොන්ත්‍රාත්තුව ?

මේ විද්‍යාඥයන් කණ්ඩායම විසින් මානව ජෙනෝමය(genome)වෙනස් කළ යුතු ය. මානව ජෙනෝමයේ රහස් හෙළි කළ යුතු ය.

"ජෙනෝමය" යනු කුමක් ද?

මෙය බොහෝ දෙනාට නොතේරෙන පදයකි. මානව ජෙනෝමයකැයි කියන්නේ මිනිසකු තැනීම සඳහා අත්‍යවශ්‍ය උපදේශ සමූහ ය යි. මේ උපදේශ මාලාව සැඟවී තිබෙන්නේ මානව සිරුරේ අන්තර්ගත ප්‍රකෝටි 100 ක් පමණ වූ සෛල තුළ යි. උපදින දරුවා කළු වේ ද? සුදු වේ ද ඔහු උස ද? මිටි ද? තර ද? කෙට්ටු ද? ආදී පැන සියල්ලට ම පිළිතුර සපයන්නේ ජෙනෝමය විසිනි. ඊටත් වඩා ප්‍රබල කරුණක් වෙයි. දරුවා කවරාකාරයේ මාරක රෝගවලට ගොදුරු වේ ද යන්න තීරණය කෙරෙන්නේත් ජෙනෝමය විසිනි. කොටින් කිවහොත් ජෙනෝමයේ ඇතුළු වී තිබෙන රහස් උපදේශය වෙන් කොට ගතහොත් අපට අප කැමති ආකාරයේ දරුවන් ලොවට දිය හැකි වේ.

1989 දි විද්‍යාඥයන්ට භාර දෙන ලද කොන්ත්‍රාත්තුව එය යි. "ජෙනෝමයේ රහස් භාෂාව හෙළි කරන්න. හෙළි කොට අප කැමති ආකාරයක දරුවන් රෝගාබාධවලට ගොදුරු නොවී දිගු කලක් වෙසෙන හැටි සොයා ගන්න." විද්‍යාඥයන්ට මේ සඳහා අවුරුදු 15 ක කාලයක් දී තිබූ නමුත් ඔවුහු අවුරුදු 11 කින් සිය පැවරුම නිමා කළහ.

2000 ජූනි මස 26 වැනි දින විද්‍යාඥයෝ සිය පර්යේෂණයේ ප්‍රතිඵල ලොවට පැවසූහ. අවුරුදු එකොළහක මහා පරිශ්‍රමයකින් පසුව ඔවුහු එදා ජෙනෝමයේ රහස් හෝඩිය ලොවට හෙළි කළහ. මේ ජෙනෝම හෝඩියේ අකුරු සංඛ්‍යාව කෝටි 310 කි. සම්පූර්ණයෙන් ම ක්‍රියාකාරීවන මිනිසකු තැනීම සඳහා අවශ්‍ය උපදේශ පිළිබඳ රහස් ලියැවී තිබෙන්නේ ඒ "අකුරු" කෝටි 310 කි.

එදා කළ ප්‍රකාශය නිසා මානව ජීවිතයේ සිදුවන වෙනස සිතා ගත නොහෙන තරම් බැරෑරුම් ය. මේ ප්‍රතිඵල මිනිසා විසින් නෙළා ගනු ලබන්නේ විසිඑක්වන සියවසේ දි ය.

මෙම මහා සොයා ගැනීම අනාවරණය කර ගත් ලොව ඇමතු ජනාධිපති බිල් ක්ලින්ටන් ඒ සොයා ගැනීමේ ප්‍රබලත්වය හොඳින් අවබෝධ කොට ගෙන සිටියේ ය. ""අපි දෙවියන් වහන්සේගේ පොතෙන් පිටුවක් ලබා ගත්තෙමු " යි ඔහු අභිමානයෙන් පැවසුවේ ය. විද්‍යාඥ කණ්ඩායමේ නායක ආචාර්ය ෆැන්ක් කොලින්ස් ද එවැනි ම පද මාලාවක් භාවිත කළේ ය.""මෙතෙක් දෙවියන් වහන්සේ පමණක් දැන සිටි රහසක් අපි අනාවරණය කොට ගත්තෙමු"යි ඔහු කියා සිටියේ ය.

මෙසේ විසිඑක්වන සියවස ආරම්භ වන්නේ මිනිසා විසින් දෙවියන් වහන්සේ සතු දේත් "සොරකම්" කරමිනි.

මේ සොයා ගැනීමේ නියම ප්‍රතිඵල විසි එක්වන සියවසේ මිනිසාට ලැබෙන්නේ 2002 දි හෝ 2003 දි ය. ජෙනෝමයේ රහස් අකුරුවලින් සොයා ගෙන තිබෙන්නේ සියයට 97 ක් පමණ. එයින් සියයට තුන එතරම් ප්‍රයෝජනයක් නැත. ඒවා හරියට සිංහල හෝඩියේ තිබෙන භාවිත නොවන අකුරු වැනියි.

මේ අනාවරණයේ ප්‍රතිඵල ලබා ගන්නට තවත් අවුරුදු දෙකක් තුනක් ගත වන්නේ ඇයි? අද සොයාගෙන තිබෙන ""අකුරු" ක්‍රමවත්ව නියම විදියට සකස් වූ ""පිටුවල""සඳහන් වේ.

එහෙත් ඒ එක් එක් පිටුවේ සඳහන් අකුරු තාමත් අවුල් වියවුල් වී පවතී. ඒ හා තිසි පරිදි හරි ගස්සා ගන්නට අවුරුදු දෙක තුනක් ගත වේ.

එසේ ක්‍රමවත්ව මේ ජීවන පිටු සකස් කොට ගත් විට ඉන් විසිඑක් වන ශත වර්ෂයේ මිනිසාට සැලසෙන සෙත කවරේ ද? මුළු මහත් වෛද්‍ය පදනමේ ම ප්‍රබල පෙරළියක් සිදුවෙයි. මාරක රෝග පිටු දැකිය හැකි වේ. ජනාධිපති බිල් ක්ලින්ටන් කිවේ ලියෝ බ්ලෙයාර් බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර්ගේ පුත්‍රයා) වැඩිහිටි වියට පත් වන විට ඔහු කැන්සර් (පිළිකා) යන පදයෙන් හඳුනා ගනු ඇත්තේ ඒ නම තිබෙන තාරකා පද්ධතිය (කටක ලග්නයේ තාරකා පංතිය) පමණකැයි යනුවෙනි.

හෘදයාබාධ පිළිකා රෝග අල්ස්හෙමර් රෝගය ඒඩ්ස් ආදියෙන් තොර ලොවක් විසිඑක්වන සියවසට උදාවන්නේ ය. මෙහි තවත් පැත්තක් ඇත්තේ ය. යම්කිසි අමානුෂික ඒකාධීපති වාදියකු විසින් තමන් කැමති ආකාරයේ අමානුෂික ප්‍රජාවක් තනමින් තමන්ගේ අණසක ප්‍රශ්න නොවිමසා පිළිගන්නා වශයෙන් ඔවුන් හැඩගස්සා ගන්නට යම්කිසි ප්‍රයත්නයක් දැරේවි ද?

කෙසේ හෝ වේවා ආරම්භයේදි මේ ජෙනෝම අනාවරණයේ ප්‍රතිඵල නෙළා ගත හැකි වන්නේ අත්‍යන්තයෙන් ම ධනවත් අයට පමණී' අධි ඉසුරුමතුන්ට පමණක් මුලින් සැපයෙන ඒ වරප්‍රසාදය ලොව සාමාන්‍ය මිනිසුන්ට ලැබෙනු ඇත්තේ විසි එක්වන සියවසේ මැද භාගයේදි ය.

විසිඑක්වන සියවසේ සන්නිවේදන විප්ලවය දෙසට දැන් අප සිත් යොමු කළ යුතු වේ.

මීට පස්වසකට පමණ පෙර ලෝකයා සිතාගෙන සිටියේ විසිඑක්වන සියවසේ ප්‍රබලතම සන්නිවේදන මෙවලම විය හැක්කේ අන්තර්ජාලය යි කියා ය. ඒ කාලයේ දි අන්තර්ජාලය දියුණු වූයේ සියයට 2000 ක පමණ වේගයෙනි.

එහෙත් දැන් පෙනෙන ආකාරයට විසිඑක්වන සියවසේ මුල් අවුරුදු පහ තුළ ඉතා ම ශීඝ්‍රයෙන් ලොව පුරා පැතිරෙන සන්නිවේදන මෙවලම“ජංගම දුරකථනය “යි. මෙය දැන් නම් කෙරන්නේ “රැහැන්

විසි එක්වන සියවසේ මුලදීම විද්‍යුත් කැමරාව වීඩියෝ ක්‍රීඩා සංගීත සම්පාදකයන් ආදි සියලු දේ ජංගම දුරකථනයෙහි තැන්පත් වේ. ඒවා එන්ට එන්ට ම කුඩාවෙයි. ඒවායේ විශාලතම අංගය වවන්නේ මුහුණත යි. අංක ලද යුතු වන්නේ ඒ මුණතට අත තැබීමෙනි. සමහර අනාගත ජංගම දුරකථන මගින් තමන් සිටින ස්ථානයේ රූප කාඩ්පත් ගෙදරට යවන උපකරණ සවිකොට ඇත්තේ ය.

විරහිත අන්තර්ජාලය” වශයෙනි. (වයර්ලස් ඉන්ටර්නෙට්)

විසිඑක්වන සියවසේ ආරම්භයේදි භාවිත වන්නේ තෙවන පරපුරේ(3G)ජංගම දුරකථන පද්ධතිය යි.

විසි එක්වන සියවසේ මුලදීම විද්‍යුත් කැමරාව වීඩියෝ ක්‍රීඩා සංගීත සම්පාදකයන් ආදි සියලු දේ ජංගම දුරකථනයෙහි තැන්පත් වේ. ඒවා එන්ට එන්ට ම කුඩාවෙයි. ඒවායේ විශාලතම අංගය වවන්නේ මුහුණත යි. අංක ලද යුතු වන්නේ ඒ මුණතට අත තැබීමෙනි. සමහර අනාගත ජංගම දුරකථන මගින් තමන් සිටින ස්ථානයේ රූප කාඩ්පත් ගෙදරට යවන උපකරණ සවිකොට ඇත්තේ ය.

තෙවන පරපුරේ ජංගම දුරකථන ත්‍රී ජී (තෙවන පරපුර) ජංගම දුරකතනයකින් ලියෝ ටෝල්ස්ටෝයිගේ පිටු 1300 ක “යුද්ධය හා සාමය” නම් නවකතාව ගෙන්වා ගන්නට ගත වන කාලය තත්පර 1.6 කි. ගමන් ගන්නා මෝටෝරියක සිට එය ගෙන්වා ගන්නට තත්පර 25 ක් ගත වේ .

ඇවිදිමින් සිටින විට ඒ සඳහා ගත වන්නේ තත්පර 8.3 කි. ජංගම දුරකථනය භාවිත කොට විවිධ බඩු බාහිරාදිය ද ලබා ගත හැකි වේ. ලෝකයේ බෙහෝ තැන්වල පුවත්පත්, චුයිංගම්, සිසිල් බීම ටින්, දුම්වැටි ආදිය අළෙවි කරන යන්ත්‍ර පිහිටුවා ඇත්තේ ය. මේවා ඉංගිරිසියෙන් “වෙන්ඩින් මැෂින්” වශයෙන් හැඳින් වේ. දැනට ම ඇතැම් රටවල ජංගම දුරකථනය ඒ යන්ත්‍රවලට යොමු කිරීමෙන් අවශ්‍ය දෑ ලද හැකි ය. ඒ සඳහා යන වියදම ජංගම දුරකථන බිලෙන් අඩු කෙරෙයි.


ජංගම දුරකතනය රූප දුරකථනයක් බවට පත් වේ. කතා කරන තැනැත්තාගේ රූපය ඇමතුම ලබන්නාටත් ඇමතුම ලබන්නාගේ රූපය කතා කරන තැනැත්තාටත් ලද හැකි වේ..

ශීඝ්‍ර වේගයෙන් දියුණු විගෙන එන ප්‍රබල තාක්ෂණ ක්‍රමයක් නම් සූක්ෂ්මිකරණ විද්‍යාව යි. (miniaturization)දැනටමත් මේ පිළිබඳ පර්යේෂණ බෙහෝ සේ දියුණු වි ඇත්තේ ය. හාල් ඇට දෙකක් උඩ නැවැත්විය හැකි හෙලිකොප්ටරයක් මේ සූක්ෂ්මිකරණ විද්‍යාව භාවිතයෙන් තැනි ඇත්තේ ය. ඇසට පෙනෙන නොපෙනෙන තරම් වූ විද්‍යුත් බල ජනකයන් දැන් මේ විද්‍යාවෙන් තැනි ඇත්තේ ය. මෙය වරපුරුෂ සේවාවට ඉතා ම වටනේ ය. මැස්සකු තරම් සූක්ෂ්ම ශබ්ද විකාශන යන්ත්‍රයක් රහස් සාකච්ජා කෙරෙන තැනක මේසයක් මත තැබූ විට ඒ මේසය වටා කෙරෙන රහස් සාකච්ජාවලට සවන් දි ගත හැකි වේ.

මේ සූක්ෂ්මිකරණ විද්‍යාවෙන් නිපදවෙන ඇතැම් තාක්ෂණික මෙවලම් අනාගත වෛද්‍ය විද්‍යාවේ ප්‍රබල අවි බවට පත් වේ. ඇතැම් ගොර්ගවලදි රෝගියාට සැත්කම් කරනු පිණිස රෝගියාගේ සිරුර ශල්‍ය කර්මයකට භාවිත කිරිම විසි-එක් වන සියවසේ ප්‍රථම දශකයේදි ම යල් පැන ගිය ක්‍රියාවලියක් වෙයි.

සූක්ෂ්මිකරණ විද්‍යාව මගින් තැනෙන ඇසට පෙනෙන නොපෙනෙන තරමේ “රොබෝ” පුද්ගලයෙක් නහරයක් ඔස්සේ රෝගියාගේ සිරුර තුළට යැවෙන්නේ ය. රොබෝ යන්ත්‍රය ක්‍රියා කරවනු ලබන්නේ බැහැරින් සැපයෙන උපදේශ අනුව යි. ඒ අනුව රොබෝ යන්ත්‍රය රෝගියාගේ හදවතට ගොස් එහි නහරවල බැඳුනු තට්ටු කපා හරී. රොබෝ යන්ත්‍රය ද සිරුර තුළම දියවී යන්නේ ය. සැත්කම් අවශ්‍ය නොවේ. ඉන්ද්‍රිය පද්ධතිය අනාගතයේදි ඉතා ම සුරක්ෂිත කිසිම ප්‍රශ්නයක් පැන නොනගින චිකිත්සා ක්‍රමයක් වේ. දැනටමත් මිනිසාට අවශ්‍ය ඇතැම් ඉන්ද්‍රිය සතුන්ගේ සිරුරුවලින් බෝකොට ගන්නට යොදා ගෙන ඇත්තේ ය.ඇස්, කන් නාසා පමණක් නෙව හදවත් ද අනාගතයේදි එසේ බෝ කොට ගත හැකි ඉන්ද්‍රියයෝ වෙති. කෘත්‍රිම රූප සකස් කෙරෙන ශල්‍ය කර්මය (ප්ලාස්ටික් සර්ජරි) ඉතා සුලබ ක්‍රියාවලියක් වේ.

විසිවන සියවසේ මහා ම විද්‍යාත්මක “ප්‍රාතිහාර්යයක්” වශයෙන් සළකන ලද්දේ ජීව පිටපත් (ක්ලොන්)තැනීමේ විද්‍යාව යයි. දෙස්තර ඉයන් විල්මට් විසින් ජීව පිටපත් ක්‍රමයෙන් සකස් කෙරුණු



දිය මතින් යා හැකි අනාගත බයිසිකලය

"ඩොලී" නැමැති බැටළු දෙන නිසා ලෝකයේ චින්තනයෙ හි ද පෙරළියක් හට ගත්තේ ය. විසිඑක් වන සියවසේහිදි මේ ජීව පිටපත් තැනීමේ ක්‍රමය විසිඑක්වන සියවසේ මැද භාගයේද සාමාන්‍ය සිද්ධියක් වන්නේ යැයි විද්‍යාඥයෝ කියති.

අද පවුලේ අයගේ ඡායාරූප "ඇල්බම්" වල (ඡායාරූප එකතු පොත්වල) ආරක්ෂිත වෙයි. මත්තේදි විසිඑක් වන සියවසේදි ඒ අජීවී ඡායාරූප වෙනුවට පවුලේ අයගේ සජීවී ජීව පිටපත් ගෙදර දෙර තබා ගත හැකි වේ. දෙමාපියන්ගේ ජීව පිටපත් තනා ගත් කල්හි මුල් දෙමාපියන් අභාවයට පත් වූ පසුවත් ඔවුහු ගෙදර සිටිති.

ජීව පිටපත් මගින් එවැනි පුද්ගලයන් තැනූ විට ඔවුන්ගේ අධ්‍යාත්මය (හිත හා හදවත))ඒ මුල් පුද්ගලයාට සමාන වේ ද? මෙය තාමත් නොවිසඳුනු ප්‍රශ්නයකි. මිනිසුන්ගේ ජීව පිටපත් තැනීම ආචාර ධර්ම විරෝධී යයි බොහෝ රටවල සළකති.

එහෙත් විසිඑක් වන සියවසේ මැද භාගයේදි එවැනි තහංචි ඉවත්වී මිනිසුන්ගේ ජීව පිටපත් තැනීමට රාජ්‍ය විසින් අවසර දෙනු ඇතැයි ඇතැම්හු සළකති.

විසිඑක් වන සියවසේ දි මේ ජීව පිටපත් ක්‍රමය මගින් ගෙදර දෙර සුරතල් සතුන් (බල්ලන් බළලුන්) සදාකාලිකව ම තබා ගත හැකි වන බව දැනටමත් විද්‍යාඥයන් විසින් පළ කොට ඇති අදහස්වලින් ස්ථිර වෙයි .විසිඑක් වන සියවසේදි සාමාන්‍ය ටෙලිෆෝනය ද ප්‍රබල විප්ලවයකට ලක් වේ. අනාගත ටෙලිෆෝනය නාද වන විට ටෙලිෆෝනය ම ගෙහිමියා වෙත යන්නේ ය. ගෙහිමියාගේ විද්යුත් ඡායාව ටෙලිෆෝනයට ඇතුළු කොට තිබෙන නිසා ඒ රෝද සහිත අනාගත ෆෝනය නාද වන විට ගෙහිමියා වෙත ගමන් ගනී.

රෝගීන් වයස්ගතයන් ආදීන්ගේ ඇඳ අසල විශේෂ ටෙලිෆෝනයක් සවිකොට ඇත්තේ ය. ඒ තැනැත්තාගේ ආශ්වාස ප්‍රශ්වාස රිද්මයේ වෙනසක් ඇනුණු හැටියේ ටෙලිෆෝනය කිට්ටු ඥතීන්ට දොස්තරට සහ ගිලන් රථයට ඒ බව දැනුම් දේ'

මෙය අත්හද බලන කාලයේ දි ඒ තැනැත්තා නපුරු සීනයක් දැක හිතෙන් කැගසන විටත් ටෙලිෆෝනය ඥතීන් ආදීන් කැඳවූයේ ය. ගෙදර කිසිවකු නොමැති විටක බැහැරින් ලැබෙන අණ පරිදි ගෙදර විදුලි පහන් දැල්වීම් වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරවීම ආදිය ද ටෙලිෆෝනය විසින් කෙරෙන්නේ ය. හොරු ආ විටෙක හෝ ගින්නක් හටගත් විට හෝ ඒ බව පොලීසියට හෝ අවශ්‍ය අයට දැනුම් දීම ද ටෙලිෆෝනය විසින් කෙරෙයි.

වරපුරුෂ ටෙලිෆෝන ද විසිඑක් වන සියවසේ ලක්ෂණයක් වේ. අයිති කරුට හොරා යමෙකු ඔහුගේ ටෙලිෆෝනයට ඉතා සූක්ෂ්ම උපකරණයක් සවිකරන්නේ ය. ඒ සවි කළ තැනැත්තා ඒ ටෙලිෆෝනයේ අංකය කැරකූ විට ඔහුට ඒ ටෙලිෆෝනය වටා කෙරෙන සාකච්ජාවලට සවන් දිය හැකිවේ. එවැනි ටෙලිෆෝනයක් ඒ වරපුරුෂයා විසින් ඇමතූ විට යන්ත්‍රය නාද නොවෙයි.

විසිඑක් වන සියවසේ ප්‍රබල චින්තනයක් වන්නේ දීර්ඝ කාලයක් යහතින් විසීමේ ක්‍රම සෙවීම යි. විසිඑක් වන සියවස තුළ එවැනි තාක්ෂණික ක්‍රම සකස් වේ යැයි විද්‍යාඥයෝ බලාපොරොත්තු වෙති. ආතර් සී. ක්ලාර්ක් විසින් තොබෝද පළ කරන ලද 3001 –අවසාන වීර චාරිකාව"නම් ග්‍රන්ථයෙන් අවුරුදු දහසක් පැරණි මළ සිරුරක් පණ ගන්වන ආකාරය ප්‍රබන්ධ කථා ස්වරූපයෙන් දක්වා ඇත්තේ ය. එවැනි න්‍යාය විසිඑක්වන සියවසේ දී ඇත්තට ම ක්‍රියාවේ යෙදෙනැ යි සිතිය හැකි ය.

විසිඑක් වන සියවසේ දී ඉතා ප්‍රබල ලෙස දියුණු වන ව්‍යාපෘතියක් නම් අජටාකාශගාමී ව්‍යාපාරය යි. සඳතලය මත සහ අඟහරු තලය මත මානව ජනපද පිහිටුවාලීමේ ව්‍යාපාරය අද ශීඝ්‍රයෙන් දියුණු වේ.

සඳ තලයේ ඉඩම් විකිනීමේ ව්‍යාපාරය දැනටමත් ක්‍රියාවේ යෙදෙන්නේ ය.

සඳ තලයේ ඉඩම් සඳහා දැනටමත් ඔප්පු ලියා ඇත්තේ ය. විසිඑක් වන සියවසේ අග භාගයේදි ඇතැමුන් විනෝද චාරිකා සඳහා සඳට යා හැකි යැයි සිතිය හැකි ය.

විසිඑක් වන සියවසේ මිනිසුනට තමන් කැමති ලෝකයක් මවා ගන්නට උපකාරී වන"වර්චුවල් රියැලිටි"" (යථා තත්ත්වයේ නියම අනුරුව) නම් තාක්ෂණයක් දැනට ම බිහිවී ඇත්තේ ය. මෙය තළලෙහි පැළඳ ගත් විට කෙනෙකුට තමා කැමති ලෝකයත් ඒ ලෝකයේ නියම ස්වරූපයෙන් ම දැක ගත හැකි වෙයි.

විසිඑක් වන සියවස පිළිබඳ අනාවැකි පළ කරන ආතර් සී. ක්ලාර්ක් "e - මොළ හිස් වැසුමක්" සඳහන් කරන්නේ ය.

මෙය පැළඳගත් විට තමන්ට ඍජුව ම අන් අයගේ මොළයට ඇතුළු විය හැකි යි. එය පැළැඳ ගත් විනිශ්චය කරුවකුට සැක්කිකරුවකු කියන්නේ ඇත්තද බොරු දැයි ඍජුව ම දැන ගත හැකි වේ. එය පැළැඳ ගත් දෙස්තර කෙනෙකුට රෝගියාගේ අසනීප තත්ත්වය රෝගියාගෙන් නොවිමසා ම දැන ගත හැකි වේ.

මෙසේ විසිඑක් වන ශත වර්ෂය අතිශයින් ප්‍රබල වෙනස්වීම් හා සාමාජයික ආචාර ධර්ම සහිත යුගයක් වෙයි.

දැනට ඇතැම් පාරිභෝගික ද්‍රව්‍යවල "බාර්කෝඩ්"" නම් සටහනක් දැකිය හැකි ය. එය සංවේදි යන්ත්‍රයකට කිට්ටු කළ විට ද්‍රව්‍යයේ මිල දත හැකි යි. විසිඑක් වන සියවසේදි අනන්‍යතා කාඩ්පත වෙනුවට මිනිසුන්ගේ ඇඟේත් එවැනි "බාර්කෝඩ්" සටහන් යෙදෙනු ඇතැයි සමහරු අනාවැකි පවසති.

එවැනි බාර්කෝඩ් සහිතව යම්කිසි ආයතනයකට ඇතුළු වන පුද්ගලයා පිළිබඳ සියලුම විස්තර ඒ ආයතනයේ පරිගණකයන් හි ඉබේ ම සඳහන් වේ.

මෙසේ විසිඑක් වන සියවස අද ඇසින් දකින විට විස්මය උපදවන කාල පරිච්ජේදයක් වෙයි.

තවත් ඉතා හොඳ ආරංචියක් නම් විසිඑක් වන සියවස මුදල් කාසි හා නෝට්ටු විරහිත යුගයක් වේ. මුදල් තිබෙන බව දක්වනු පිණිස සාක්කුවේ කාසි සෙලවීම විසිඑක් වන සියවසේදි අවශ්‍ය නොවේ. සියලු ම ගනුදෙනු අන්තර්ජාලයෙන් හා ජංගම දූරකථනයෙන් කළ හැකි වේ.

විසිඑක් වන සියවසේ මිනිසා තාක්ෂණික නිර්මාණයක් වනු ඇතැයි කොටින් කිවයුතු වේ. ❑



ජීව පිටපත ක්‍රමයට බිහි වූ ඩොලි නිසා ලෝක චින්තනයේ පෙරළියක් ඇති විය.

**විසිඑක් වන සියවස පිළිබඳ අනාවැකි පළ කරන ආතර් සී. ක්ලාර්ක් "e මොළ හිස් වැසුමක්" සඳහන් කරන්නේ ය. මෙය පැළඳගත් විට තමන්ට ඍජුව ම අන් අයගේ මොළයට ඇතුළු විය හැකි යි. එය පැළැඳ ගත් විනිශ්චය කරුවකුට සැක්කිකරුවකු කියන්නේ ඇත්තද බොරුදැ යි ඍජුව ම දැන ගත හැකි වේ.**